පොදු චක්‍ර ලේඛ 01/2024

මාගේ අංකය-DCDSP/02/18/03
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
පෙට්ටිගලවත්ත, ගාල්ල
2024/01/03

දකුණු පළාතේ විවිධ සේවා සමූපකාර සමිති ඇතුළු
සියලුම සමූපකාර සමිතිවල ගරු සභාපතිවරුන් වෙත,

**සමූපකාර සමිති අනුගමනය කල යුතු වත්කම් මිලදී ගැනීම,බැහැර කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

උක්ත කරුණට අදාළව මා විසින් නිකුත් කරන ලද 2018.05.18 දිනැති අංක දපස/සමු.සං/සං./18 දරණ පොදු චක්‍රලේඛ/02/2018 චක්‍රලේඛයේ 09 වගන්තියේ සදහන් මාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතියක් ලබා දීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමේ කාල සීමාව මාගේ සමාංක 2020.08.19 දිනැති ලිපිය මගින් 2020.12.31 දින දක්වාද, සමාංක 2021.02.05 දිනැති ලිපිය මඟින් 2021.06.30 දින දක්වාද, 2021.10.11 දිනැති ලිපිය මගින් 2021.12.31 දින දක්වාද, සමාංක 2022.06.30 දිනැති පොදු චක්‍ර ලේඛ 01/2022 මගින් 2022.12.31 දින දක්වාද,වරින් වර දීර්ඝ කරන ලදී.

02. එමෙන්ම මාගේ අංක දපස/සමු.සං/සං/18 දරණ 2020.08.19 දිනැති ලිපියේ 03 ඡේදයෙහි දක්වා ඇති පරිදි මාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම සඳහා විශේෂ අනුමැතියක් ලබා දීම 2018.05.18 දිනට පෙර සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා පමණක් අදාළ වුවද, ඉහත දක්වා ඇති පොදු චක්‍ර ලේඛ 01/2022 මගින් එම දිනයද 2022.06.30 දිනය දක්වා දිර්ඝ කරන ලදි.

03. එහෙත් එම කාල සීමාව තුළ ඉහත දැක්වූ ආකාරයේ දේපළ අත්පත් කර ගැනීම්, ඉදි කිරීම් හෝ බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතියක් ලබාගැනීම සම්බන්ධ ගොනු සකස් කර තිබුනද හා ඊට අදාල කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ගැනීමට නොහැකි වූ අවස්ථාවන් පවතින බැවින් එවැනි ඉල්ලීම් සඳහා විශේෂ අනුමැතියක් ලබා දීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමේ කාල සීමාව තවදුරටත් දික් කරන ලෙස සමූපකාර සමිති විසින් මා වෙතින් ඉල්ලීම් සිදු කර ඇත.

04. ඒ අනුව එම ඉල්ලීම් සලකා බලා පොදු චක්‍ර ලේඛ 01/2022 හි සඳහන් මාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතියක් ලබා දීම 2022.06.30 දිනට පෙර සිදු කරන ලද අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා පමණක් අදාල වන්නේය යන වගන්තියේ සඳහන් දිනය 2023.12.31 දිනය දක්වා සංශෝධනය කරමින්ද, 2023.12.31 දින හෝ එදිනට පෙර සිදු කරන ලද අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් වලට අදාළ ගොනු මා වෙත ඉදිරිපත් කල යුතු අවසාන දිනය 2022.12.31 දින සිට 2024.06.30 දක්වා දීර්ඝ කරමින්ද පොදු චක්‍ර ලේඛ 01/2022 හි විධිවිධාන පහත කොන්දේසියට යටත්ව මෙයින් සංශෝධනය කරමි.

**කොන්දේසිය- 2023.12.31 දිනට පෙර සිදු කරන ලද අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් වලට අදාළ ගොනු අනුමැතිය ලබා ගැනීම සඳහා මා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් හා සාධාරණ උත්සාහයක් සමිතිය විසින් දරා ඇති බව පිළිගත හැකි ලේඛණ ඉදිරිපත් කරනු ලබන සමූපකාර සමිති සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල වන්නේය.**

06. තවද මෙම චක්‍රලේඛයේ 04 වන ඡේදයේ දක්වා ඇති දින පිළිබඳ වන සංශෝධනයන්ට යටත්ව වරින් වර සංශෝධිත පොදු චක්‍රලේඛ/02/2018හි හා/හෝ ඊට අදාල සංශෝධිත චක්‍ර ලේඛ/ ලිපි වල සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් නොවෙනස්ව මේ සම්බන්ධයෙන් අදාළ වන බවත්, නැවත කිසිදු හේතුවක් මත මෙම කාල සීමාව දීර්ඝ නොකරන බවත් කාරුණිකව දන්වමි.

07. කෙසේ වුවද සමුපකාර සමිති විසින් වත්කම් අත්පත් කර ගැනීමේදී හෝ බැහැර කිරීමේදි විධිමත් ක්‍රියාවලියට පටහැනිව කටයුතු කිරීමෙන් සමිතියට යම් මූල්‍ය අලාභයක්/හානියක් සිදුවී ඇති බව ඒ පිළිබඳව සිදු කරන පරීක්ෂණයකදි අනාවරණය වුවහොත් අදාල අලාභය/හානිය ඇති වීමට පදනම් වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ අය විසින් සමිතියට සිදුව ඇති මූල්‍යමය හානිය/ අලාභය පිළිබඳ වූ වගකීම තනි තනිව හා/හෝ සාමූහිකව දැරිය යුතු බවද මෙයින් අවධාරණය කරමි.

08. තවද 2023.12.31 දිනට පෙර සමුපකාර සමිති විසින් සිදු කරන ලද වත්කම් මිලදී ගැනීම හා බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතිය ලබා දීමේ හැකියාව ම විසින් නියම කර ඇති සීමාවන්ට යටත්ව දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරු සතු වන බැවින් ඊට අදාල ඉල්ලීම් තම දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

කේ. පී. ජී. සුමිත් ශාන්ත,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත

කේ.පී.ජී. සුමිත් ශාන්ත
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්

1. සහකාර කොමසාරිස් (ප්‍රධාන කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට)-කාරු. දැ.පි. හා අ.ක.ස
2. සියළුම දිස්ත්‍රික් නිලධාරීන් - කාරු. දැ.පි. හා අ.ක.ස
3. සියළුම මූලස්ථාන සංවර්ධන නිලධාරීන් - කාරු. දැ.පි. හා අ.ක.ස
4. සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් - කාරු.දැ.පි. හා සමු. සමිති දැනුවත් කිරීම සඳහා